# 1998 - රසායන විද්‍යාව - I පිළිතුරු

| | | | | |
|---|---|---|---|---|
| 1. (3) | 2. All | 3. (5) | 4. (4) | 5. (2) |
| 6. (5) | 7. (3) | 8. (2) | 9. (4) | 10. All |
| 11. (3) | 12. (5) | 13. (4) | 14. (4) | 15. (3) |
| 16. (2) | 17. (3) | 18. (5) | 19. (2) | 20. (3) |
| 21. (4) | 22. (2) | 23. (2) | 24. (4) | 25. (4) |
| 26. All | 27. (5) | 28. (5) | 29. (5) | 30. (3) |
| 31. (2) | 32. (4) | 33. (3) | 34. (5) | 35. (1) |
| 36. (4) | 37. (3) | 38. (1) | 39. (4) | 40. (1) |
| 41. (2) | 42. (4) | 43. (4) | 44. (1) | 45. (5) |
| 46. (2) | 47. (2) | 48. (5) | 49. (2) | 50. (4) |
| 51. All | 52. (5) | 53. (3) | 54. (4) | 55. (3) |
| 56. (4) | 57. (5) | 58. All | 59. (3) | 60. (4) |

## රසායන විද්‍යාව II
## "අ" කොටස - ව්‍යුහගත රචනා

01 (a) (i) $^{12}_{6}C$ / (C - 12 සමස්ථානිකයේ ) හරියට 12 g ක ඇති $^{12}_{6}C$ පරමාණු සංඛ්‍යාව (20)

(ii) $6.022 \times 10^{23}$ ( $6.023 \times 10^{23}$) (10)

(iii) $mol^{-1}$ (10)

(b) $FeS_2O_3$ - අයන්(II) තයෝසල්ෆේට් - හෝ ෆෙරස් තයෝසල්ෆේට් (15)

$Cr_2(MnO_4)_3$ - ක්‍රෝමියම්(III) මැංගනේට් හෝ ක්‍රෝමික් මැංගනේට් (15)

(c) (i) $4d^2\ 5s^2$ ($5s^2\ 4d^2$) (15)

(ii) $X_3N_4$ (15)

100

2

(i) $2H_3PO_4(aq) + 3Ba(OH)_{2(aq)} \rightarrow Ba_3(PO_4)_{2(s)} + 6H_2O_{(l)}$

(ii) අවශ්‍ය වූ $Ba(OH)_2$ පරිමාව $Vcm^3$ නම්

I ක්‍රමය

$0.12\ mol\ dm^{-3}$ ද්‍රාවණයේ $25\ cm^3$ ක ඇති $H_3PO_4$ මවුල සංඛ්‍යාව $(0.12 moldm^{-3} \times \frac{25cm^3}{1000cm^3}\ dm^3$

$= 0.12\ moldm^{-3} \times \frac{25}{1000}\ dm^3$

$= \frac{3}{1000}$ mol / (0.003 mol) (3)

$0.2\ moldm^{-3}$ $Ba(OH)_2$ ද්‍රාවණයේ $Vcm^3$ ක ඇති $Ba(OH)_2$ මවුල සංඛ්‍යාව

$= 0.2\ mol\ dm^{-3} \times \frac{V}{1000}\ dm^3$

$= \frac{0.2\ V}{1000}$ mol (3)

ප්‍රතික්‍රියාවේ ස්ටොයිකියොමිතිය අනුව

$\frac{H_3PO_4 \text{ මවුල සංඛ්‍යාව}}{Ba(OH)_2 \text{ මවුල සංඛ්‍යාව}} = \frac{2}{3}$ (5)

$\frac{\frac{3}{1000}\ mol}{\frac{0.2\ V}{1000}\ mol} = \frac{2}{3}$

$\frac{3}{0.2\ V} = \frac{2}{3}$

$V = \frac{3}{0.2} \times \frac{3}{2}$

$V = 22.5$ (3)

අවශ්‍ය $Ba(OH)_2$ ද්‍රාවණ පරිමාව $22.5\ cm^3$ (3)

(II) වන ක්‍රමය

I ක්‍රමයේ $H_3PO_4$ හා $Ba(OH)_2$ මවුල ගණන සොයන්න. (3+3)

සමීකරණයේ අනුපාතය වන පරිදි $H_3PO_4$ මවුල එකක් සඳහා $Ba(OH)_2$ මවුල 3/2 ක් අවශ්‍ය වේ. (5)

∴ සමීකරණයේ අනුපාතය විසින් $H_3PO_4$ මවුල $\frac{3}{1000}$ සඳහා $Ba(OH)_2$ $\frac{3}{2} \times \frac{3}{1000}$ මවුල අවශ්‍ය වේ.

$\frac{0.2V}{1000} = \frac{3}{2} \times \frac{3}{1000}$ mol

$V = \frac{3}{2} \times \frac{3}{0.2}$ (3)

$V = 22.5$

අවශ්‍ය $Ba(OH)_2$ පරිමාව $= 22.5\ cm^3$ (3)

(3)

(III) වන ක්‍රමය $\frac{M_A V_A}{M_B V_B} = \frac{n_A}{n_B}$ සම්බන්ධය යෙදීමෙන්

$\frac{0.12\ mol\ dm^{-3} \times \frac{25}{1000} dm^3}{0.2 mol\ dm^{-3} \times \frac{V}{1000}\ dm^3} = \frac{2}{3}$ (11)

$\frac{0.12 \times 25}{0.2 \times V} = \frac{2}{3}$ (3)

$\frac{3}{0.2\ V} = \frac{2}{3}$

$V = \frac{3}{0.2} \times \frac{3}{2}$

$V = 22.5$ (3)

අවශ්‍ය $Ba(OH)_2$ පරිමාව $22.5\ cm^3$ වේ. (3)

(b) ආම්ලිකෘත $K_2Cr_2O_7$ ද්‍රාවණය දම් කරන්න / රත් කරන්න. HBr දුඹුරු පැහැති දුමාරයක් / HI දම් පැහැති දුමාරයක් ලබා දෙයි. (15)

(c) ප්‍රතික්‍රියකවල භෞතික ස්වභාවය උෂ්ණත්වය, ආලෝකය / විකිරණ සාන්ද්‍රණය, උත්ප්‍රේරක, පීඩනය, පෘෂ්ඨය (25)

(d) ක්‍රමය I

වැඩිපුර ක්ලෝරීන් දියර එකතු කරන්න.

එතුළින් $H_2S$ වායුව යවන්න.

ආම්ලික $CuSO_4$ ද්‍රාවණ අවක්ෂේපයක් ලබාදේ/ ආම්ලික $NiSO_4$ ද්‍රාවණ අවක්ෂේපයක් ලබා නොදේ. (25)

(100)

ක්‍රමය II

ක්ලෝරීන් දියර තුළින් $H_2S$ වායුව යවා, ඉන් වැඩිපුර ද්‍රාවණ 2 ට දමන්න. ලබන ප්‍රතිඵල ලබා දේ.

3 (a) ක්‍රමය I

$C_xH_y(g) + \left(x + \frac{y}{4}\right) O_2(g) = xCO_2(g) \frac{y}{2} H_2O(l)$

$\frac{CO_2 \text{ පරිමාව}}{C_xH_y \text{ පරිමාව}} = X$ (3)



Scanned by CamScanner

(ii) 1. $CuCO_3$ දියවී $CO_2$ ලබා දේ.

$$CuCO_{3(s)} + 2HCl_{(aq)} \longrightarrow CuCl_{2(aq)} + CO_{2(g)} + H_2O_{(l)}$$

2. $CuCl_2$ ජල ද්‍රාවණයේ $[Cu(H_2O)_6]^{2+}_{(aq)}$, $Cu^{2+}_{(aq)}$ හෝ $Cu^{2+}$ සදා නිල් පැහැයක් ලබා දේ

$$Cu^{2+}\ 6H_2O_{(l)} \longrightarrow [Cu(H_2O)_6]^{2+}$$

හෝ

$$Cu^{2+} + {}_{(aq)}H_2O_{(l)} \longrightarrow Cu^{2+}_{(aq)} / [Cu(H_2O)_6]^{2+}_{(aq)}$$

3. HCl එකතු කරන විට සංකීර්ණ අයනයේ වූ $H_2O$ අණු, $Cl^-$ මගින් ප්‍රතිස්ථාපනය වී විවිධ සංයුතියෙන් යුත් සංකීර්ණ අයන ලබා දේ. මේවා කොළ පැහැතියි.

$$[Cu(H_2O)_6]^{2+}_{(aq)} + Cl^-_{(aq)} \longrightarrow [CuCl(H_2O)_5]^+$$

හෝ

නිල් පැහැති $[Cu(H_2O)_6]^{2+}$, කහ / දුඹුරු පැහැති $[CuCl_4]^{2-}$ සමග කොළ පැහැයක් ලබා දේ.

4. වැඩිපුර HCl සමග Cu2+, [CUCl4]2- සංකීර්ණ අයනය සාදයි. මෙය කහ / දුඹුරු පැහැතිය.

$$[Cu(H_2O)_6]^{2+}_{(aq)} + 4Cl^-_{(aq)} \longrightarrow [CuCl_4]^{2-}_{(aq)} + 6H_2O_{(l)}$$

හෝ

$$Cu^{2+} + 4Cl^- \longrightarrow [CuCl_4]^{2-}$$

(ඕනෑම 3 - 45)

(C) 1. $SO_2$ මගින් වාතය හෝ ජලය හෝ පස දූෂණය.
2. $SO_3$ මගින් වාතය හෝ ජලය හෝ පස දූෂණය.
3. $H_2SO_4$ මීදුම හා දූමාරය මගින් වාතය හෝ ජලය හෝ පස දූෂණය
4. S දහනය නිසා වාත දූෂණය
5. S නිධි කර කිරීම මගින් වාත දූෂණය.
6. S නිධි කර කිරීම මගින් As වැනි විෂ ද්‍රව්‍ය මුක්ත වීම.
7. ඉන්ධන දහනය මගින් වාත දූෂණය.
8. ගල්අඟුරු ඇතුළු වාතය දූෂණය කරයි.

(ඕනෑම 5 ක් - 50

150

12 (a)

CO - විෂ (හිමොග්ලොබින් මගින් $O_2$ ලබාගැනීම අඩු කරයි.)

$CO_2$ - හරිතාගාර ආචරණය, වායුගෝලය උණුසුම් වීම

$NO_2$ - අම්ල වැසි, ඕසෝන් ස්ථරයේ ඝනකම අඩු වීම.

$SO_2$ - අම්ල වැසි.

NO - විෂ, ඕසෝන් ස්ථරයේ ඝනකම අඩු වීම

Pb - ශ්වසන ගැටළු, විෂ

තාපය - වායුගෝලය උණුසුම් වීම, ශාක හා සතුන්ට හානි පැමිණීම.

As - විෂ

හයිඩ්‍රොකාබන - ශ්වසන ගැටළු, පෙනහළු ආබාධ.

පෙරොක්සිඇසිටයිල් සංකීර්ණ - ශ්වසන ගැටළු, පෙනහළු ආබාධ

ධූලි - ශ්වසන ගැටළු, පෙනහළු ආබාධ

දැලි C - ශ්වසන ගැටළු, පෙනහළු ආබාධ

(ඕනෑම 5 ක් - 50)

(b) 1. මිශ්‍රණයේ නියැදි සාම්පලයක් ගන්න. ජලය සමග සොලවන්න. පෙරන්න. වියළා $BaCO_3$, ඩොලමයිට් හා සිලිකන් ඩයොක්සයිඩ් ස්කන්ධය කිරා ගන්න. ස්කන්ධ වෙනසින් $K_2CO_3$ ස්කන්ධය නිර්ණය කළ හැකිය.

2. (1) හි අවශේෂය ලබාගන්න (එනම් $K_2CO_3$, ඩොලමයිට්, සිලිකන් ඩයොක්සයිඩ් අඩංගු) වැඩිපුර HCl එකතු කරන්න. සිලිකන් ඩයොක්සයිඩ් පෙරා ඉවත් කරන්න. වියළා එහි ස්කන්ධය කිරා ගන්න. එයින් $SiO_2$ ස්කන්ධය ලැබේ.
3. (2) හි දී මෝචනය වූ $CO_2$ එකතු කරගන්න. පීඩනය, උෂ්ණත්වය හා $CO_2$ පරිමාව මැන ගන්න. එමගින් ස. උ. පී. හිදී $CO_2$ පරිමාව සොයා ගන්න. එමගින් ($BaCO_3$, ඩොලමයිට් වලින්) නිදහස් වූ $CO_2$ මවුල ගණන සොයා ගන්න.

4. (3) න් ලබාගත් ද්‍රාවණයට තනු $H_2SO_4$ එකතු කර, $BaSO_4$ අවක්ෂේපය පෙරා ඉවත් කරන්න. වියළා ස්කන්ධය කිරන්න. ඉන් $BaCO_3$ ප්‍රමාණය නිර්ණය කළ හැකිය.

5. (4) න්, $BaCO_3$ මගින් නිදහස් වූ $BaCO_3$ මගින් නිදහස් වූ $CO_2$ මවුල සංඛ්‍යාව සොයන්න.

6. (3) න් ලද $CO_2$ මවුල ගණනින්, (5) න් ලද $CO_2$ මවුල ගණන අඩු කිරීමෙන්, ඩොලමයිට් මගින් නිදහස් වූ $CO_2$ මවුල ගණන සොයා ගත හැකිය.
7. ඩොලමයිට් ($CaCO_3.MgCO_3$) 1 මවුලයකින් $CO_2$ මවුල 2ක් ලබා දෙන්නේ යයි සලකා ඩොලමයිට් මවුල සංඛ්‍යාව ගණනය කර, ඉන් ඩොලමයිට් ප්‍රමාණය සොයාගත හැකිය.

(C) ක්‍රමය II

1. දන්නා (හෝ මැනගත්) පරිමා සාම්පලයක් ලබාගන්න. (10)

2. ජලීය NaOH මගින් යුජිනෝල් ඉවත් කර ගන්න. (10)

3. 2, 4 - ඩයිනයිට්‍රොෆීනයිල් හයිඩ්‍රසීන් මගින් සිනමැල්ඩිහයිඩ් හා කැම්ෆර් ඉවත්කර ගන්න. (බේරන පුනීලයක් ආධාරයෙන්) ප්‍රතික්‍රියා නොකළ ද්‍රව්‍ය වෙන්කර ගන්න. (10)

4. ප්‍රතික්‍රියා නොකළ පරිමාව මැන ගන්න.
පරිමාව අනුව ඇනිතෝල් ප්‍රතිශතය ගණනය කරන්න. (10)

150

ක්‍රමය II

1. දන්නා (හෝ මැනගත්) පරිමා සාම්පලයක් ගන්න. (10)

2. ආම්ලික හෝ භාෂ්මික මාධ්‍යයක දී තනුක $KMnO_4$ සමග ඔක්සිකරණය කරන්න. (10)

3. බේරුම් පුනීලයකින් ප්‍රතික්‍රියා නොකළ ද්‍රව්‍ය ඉවත් කරන්න. (10)

4. ප්‍රතික්‍රියා නොකළ කොටසේ පරිමාව මැන, ඇනිතෝල් පරිමාව අනුව ප්‍රතිශතය ගණනය කරන්න.